(සලාතය සඳහා වන) ඇරයුමෙහි හා පළමු පේළියේ පවතින දෑ (මහිමය) මිනිසුන් දැනගෙන සිටියා නම්, පසුව ඒ වෙත කුසපත් ඇදීමෙන් මිස එය ඔවුනට ලබා ගත නොහැකි වී නම්, ඔවුන් (ඒ සඳහා) කුසපත් අදිනු ඇත

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "(සලාතය සඳහා වන) ඇරයුමෙහි හා පළමු පේළියේ පවතින දෑ (මහිමය) මිනිසුන් දැනගෙන සිටියා නම්, පසුව ඒ වෙත කුසපත් ඇදීමෙන් මිස එය ඔවුනට ලබා ගත නොහැකි වී නම්, ඔවුන් (ඒ සඳහා) කුසපත් අදිනු ඇත. වේලාසනින් සලාතයට යෑමේ පවතින දෑ ඔවුන් දැනගෙන සිටියා නම්, (ඒ සඳහා) තරඟ වදිනු ඇත. රාත්රී (ඉෂා) සලාතයේ හා උදෑසන (සුබ්හු) සලාතයේ ඇති දෑ ඔවුන් දැනගෙන සිටියා නම්, ඒ
දෙක සඳහා බඩගාමින් හෝ පැමිණෙනු ඇත." [صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්රකාශ කර සිටියහ: (සලාතය සඳහා වන) ඇරයුමෙහි හා පළමු පේළියේ පවතින දෑ මහිමය, ශේර්ෂ්ඨත්වය හා සමෘද්ධිය මිනිසුන් දැනගෙන සිටියා නම්, පසුව ඒ සඳහා ප්රමුඛත්වය ගැනීමට හා පෙරට වීමට සුදුසුකම් ඇති උදවිය තෝරා ගැනීමේ දී කුසපත් ඇදීම මිස වෙනත් ක්රමයක් නොවී නම්, ඒ සඳහා ඔවුන් කුසපත් අදිනු ඇත. සලාතය සඳහා එය ආරම්භ වේලාවේ වේලාසනින් යෑමේ පවතින මහිමය ඔවුන් දැනගෙන සිටියා නම්, ඒ සඳහා ඔවුන් තරඟ වදිනු ඇත. රාත්රී ඉෂා සලාතයට හා උදෑසන සුබ්හු සලාතයට පැමිණීමෙහි ඇති කුසල්හි ප්රමාණය ඔවුන් දැනගෙන සිටියා නම්, ඒ දෙක වෙත ළදරුවකු දණ ගසා පැමිණෙන්නාක් මෙන් බඩගාමින් හෝ ඔවුන් පැමිණෙනු ඇත.

http://sunnah.global/hadeeth/si/show/65735